# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,394—1962 නොවැම්බර් 16 වැනි සිකුරාදා—1962.11.16

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙන ම ගොනු කර ගත හැකිපරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 1565 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 1565 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | 1566 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 1567 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1568 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත් කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1571 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 460**

අංකය : ඩී. 31/රෙක් ව්.

### යුද්ධ හමුදාව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම් හා පත් කිරීමක්

**උසස් කිරීම්**

ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් සඳහන් කර ඇති දිනයන්හි සිට, තාවකාලික ලුතිනන් කර්නල්වරු වශයෙන් :—

මේජර් මල්ලිය වඩු ගුණදාස ජෝර්ජ් රණතුංග, ල.යු.පො.සේ.බ.—1962 ඔක්තෝබර් 1.

මේජර් අර්නස්ට් රෝයි පෙන්ඩ්‍රාස්ට් ද සිල්වා, ල.හේ.පො.බ.—1962 ඔක්තෝබර් 1.

මේජර් බෙල්ලනගේ පර්සි ප්‍රනාන්දු ජයරත්න, ල.යු.පො.සේ.බ.—1962 පෙබරවාරි 20.

**පත් කිරීමක්**

1962 පෙබරවාරි 20 වැනි දින සිට හමුදා වැටුප් පාලක හා ලේඛන භාර නිලධාරි වශයෙන් :—

තාවකාලික ලුතිනන් කර්නල් බෙල්ලනගේ පර්සි ප්‍රනාන්දු ජයරත්න, ල.යු.පො.සේ.බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 5 වෙනිදා,
කොළඹ දීය.

11-590

**1962 අංක 461**

අංකය : ඩී/වීඑෆ්/22/ඒ.

### යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලද ඉල්ලා අස්වීමක්

1962 මැයි 22 වැනි දින සිට, යුද්ධ හමුදාවේ ස්වේච්ඡා හට සේනාවේ පහත නම් සඳහන් නිලධාරියා සිය අධිකාරයෙන් ඉල්ලා අස්වීම අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පිළිගෙන තිබේ.

උප ලුතිනන් ලක්ෂ්මිනාත් වීරසේකර මැදිවක—ල.සි.රෙ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 1 වෙනිදා,
කොළඹ දීය.

11-551

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 462**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත් කිරීම කරන ලෙස නියම් කර ඇත්තේ ය :—

ඒ. 301/61.

1961 ඔක්තෝබර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු සිවිල් සේවක ආර්. බී. වීරකෝන් මහතා අග්‍රාමාත්‍ය ලේකම් ලෙස වැඩ බැලීමට.

එන්. පී. විජයරත්න,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 නොවැම්බර් මස 12 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.
තැ. පෙ. 500.

11-758

අංකය : පීඑල්/ඊ. 4/59.

ඩී. බී. ඇල්ලේපොල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ශ්‍රී පද්මනාදන් මහතා 1962 නොවැම්බර් 9 වැනි දින සහ 12 වැනි දින සිට 14 වැනි දින දක්වා සහ 16 වැනි දිනද, බදුල්ල දිස්ත්‍රික්කයේ වෙල්ලස්ස-බින්තැන්නේ සහ බුත්තල ගම්බද උසාවි සභාපති ධුරයේ හා යටිකිඳ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 5/53.

ඒ. බී. අළුවිහාරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. සී. විජේසිංහ මහතා 1962 නොවැම්බර් 15 වැනි දින සිට 17 වැනි දින දක්වා, අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරළේ සහ පාත බුලත්ගම සහ ඇතුළුගම් සහ පනාවල් කෝරළයන්හි ගම්බද උසාවි සභාපති ධුරයේ හා බෙලිගල් හා කුරුවිටි කෝරළයන්හි ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 නොවැම්බර් 8 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්‍යාලය,
තැ. පෙ. අංකය : 573, කොළඹ 12.

11-690

---

# වෙනත් පත්කිරීම් ආදිය

**1962 අංක 464**

20 වැනි පරිච්ඡේදය වන ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වැනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

අංකය : ඒඅයි 18/2/62.

1962 ඔක්තෝබර් මස 10 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරලයේ පල්ලේ පත්තුව සහ උඩපත්තුව ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ජේ. එස්. බණ්ඩාර මහතාද,

අංකය : අයිඑන්කථු/එල් 18/4/57.

1962 ඔක්තෝබර් මස 24 වැනි දින සිට ඒ. ඒ. හේමචන්ද්‍ර මහතා නැවත වැඩ භාරගන්නා තුරු බදුල්ල දිස්ත්‍රික්කයේ පට්ටිපොළ කෝරලේ හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් පී. බී. රත්නායක මහතාද,

අංකය : ඒඅයි 10/5/62.

1962 නොවැම්බර් මස 15 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු වව්නියා දිස්ත්‍රික්කයේ මාමඩුව කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් කේ. හේරත්හාමි මහතාද,

අංකය : ඒඅයි 10/4/62.

1962 නොවැම්බර් මස 15 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු වව්නියා දිස්ත්‍රික්කයේ පුතුකුඩිරිප්පු ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් කේ. කුඩ්ඩිතම්බි මහතාද,

අංකය : ඒඅයි 8/5/62.

1962 ඔක්තෝබර් මස 11 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉහල මාරකඩ කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ඇඩ්වින් කොඩිකාර මහතාද,

අංකය : ඒඅයි 8/4/62.

1962 ඔක්තෝබර් මස 11 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු හම්බන්තොට දිස්ත්‍රික්කයේ කටුවන සහ කිරම පරණගම් පලාතෙහි හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් ඊ. වීරසේකර මහතාද,

අංකය : ඒඅයි 8/3/62.

1962 ඔක්තෝබර් මස 11 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු හම්බන්තොට දිස්ත්‍රික්කයේ කහවත්ත පහල වලකඩ කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ඩබ්ලිව්. ගුණරත්න මහතාද,

අංකය : ඒඅයි 3/6/62.

1962 ඔක්තෝබර් මස 11 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු මහනුවර දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරලයේ (හැටන් ප්‍රදේශය) හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් පී. තිසේරා මහතාද,

අංකය : අයිඑන්කථු/එල් 1/3/57.

1962 නොවැම්බර් මස 10 වැනි දින සිට එල්. පී. ඊ. කරුණා රත්න මහතා නැවත වැඩ භාරගන්නා තුරු කොළඹ දිස්ත්‍රික්කයේ මීගමු නගර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂකවර යෙකු වශයෙන් ක්‍රිස්ටි ද කෲස් මහතාද,

අංකය : ඒඅයි 3/5/62.

1962 ඔක්තෝබර් මස 16 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු මහනුවර දිස්ත්‍රික්කයේ උඩපලාත කඳුකර පහල කෝරලේ හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ඩී. එම්. ගුණරත්න මහතාද,

අංකය : ඒඅයි 3/7/62.

1962 නොවැම්බර් මස 10 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර මැදපලාත කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ඩී. බී. වීරසේකර මහතාද,

අංකය : ඒඅයි 3/9/62.

1962 ඔක්තෝබර් මස 16 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු මහනුවර දිස්ත්‍රික්කයේ වෙඩරුව කෝරලේ හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් අයි. එල්. පුංචිබණ්ඩාර මහතාද,

අංකය : අයිඑන්කථු/එල් 18/4/62.

1962 නොවැම්බර් මස 2 වැනි දින සිට ඩබ්ලිව්. බී. හිඟුරුකඩුව මහතා නැවත වැඩ භාරගන්නා තුරු බදුලු දිස්ත්‍රික්කයේ කඳුකර කෝරලේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් පී. බී. රත්නායක මහතාද,

අංකය : ඒඅයි 11/2/62.

1962 ඔක්තෝබර් මස 18 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු මන්නාරම් දිස්ත්‍රික්කයේ මන්නාරම් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ජේ. වී. පෙල්ඩානෝ මහතාද පත්කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් මස 12 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

11-776

---

**1962 අංක 465**

මගේ අංකය : ඒජේ. 5/11/61.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින් :—

1. එච්. එම්. දොන් විලියම් ගුණසේකර මහතා ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්වයකරුවකු වශයෙන්ද,
2. කේ. ඒ. සරණපාල මහතා ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්වයකරුවෙකු වශයෙන්ද,
3. කේ. වී. තම්බිතුරේ මහතා යාපනේ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්වයකරුවෙකු වශයෙන්ද,
4. එම්. එම්. අබුබකර් මහතා යාපනේ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්වයකරුවෙකු වශයෙන්ද පත්කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
ස්ථිර ලේකම්.

1962, නොවැම්බර් මස 9 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

11-779

---

**1962 අංක 466**

අංකය : ඊඅාර්. 16/49.

**සතුරන් සමග වෙළඳාම් කිරීම පිළිබඳ 1936 යේ ආරක්ෂක නියෝග**

සතුරන් සමග වෙළඳාම් කිරීම පිළිබඳ 1936 යේ ආරක්ෂක නියෝග යන්හි, 1948 පෙබරවාරි 5 වෙනි දින සංශෝධනය කරන ලද ප්‍රකාශනයේ නියෝග 6 (ඒ) අනුව පැවරී තිබෙන බලය ප්‍රකාර ගරු අධිකරණ ඇමතිතුමා, 1962 ඔක්තෝබර් මස 20 වෙනි දින සිට

නියෝජ්‍ය මහාභාරකාර එච්. සමරනායක මහතා මහාභාරකාර තැන වශයෙන් වැඩ බලන කාලයතුල, සතුරු දේපොල පිළිබඳ බාරකාර තැන වශයෙන් වැඩ බැලීමට පත් කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩ බලන
ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් මස 7 වෙනි දින,
කොළඹ 12, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

11-562

---

1962 අංක 467

අංකය : ඩී. 32/රෙක් ව්.

**නිලධාරීන්ගේ උසස් කිරීම්—රාජකීය ලංකා නාවික හමුදාව**

1962 ඔක්තෝබර් මස 1 වැනි දින සිට ලයිතන් හැටියට.
උප ලයිතන් ඒ. ආර්. සී. ප්‍රනාන්දු, රා.ලං.නා.හ.

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 2 වෙනිදා,
කොළඹ දීය.

11-550/1

---

1962 අංක 468

අංකය : ඩී. 32/රෙක් ව්.

**නිලධාරීන් පත් කිරීම්—රාජකීය ලංකා නාවික හමුදාව**

1962 අප්‍රේල් 28 වැනි දින සිට උප ලයිතන් (නැව් කාර්මික) හැටියට.

වැඩ බලන උප ලයිතන් (නැව් කාර්මික) ඩී. ඩී. වික්‍රමනායක, රා.ලං.නා.හ.

1962 අප්‍රේල් 28 වැනි දින සිට උප ලයිතන් (ඉ) හැටියට.
වැඩ බලන උප ලයිතන් (ඉ) සී. ජේ. ලෝටන්, රා.ලං.නා.හ.

1962 අප්‍රේල් 28 වැනි දින සිට උප ලයිතන් හැටියට.
වැඩ බලන උප ලයිතන් ඩබ්ලිව්. එච්. රොබට්සන්, රා.ලං.නා.හ.

1962 අප්‍රේල් 28 වැනි දින සිට උප ලයිතන් (ඇල්) හැටියට.
වැඩ බලන උප ලයිතන් (ඇල්) කෲ. සී. ජේ. ඩෙකර්, රා.ලං.නා.හ.

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 2 වෙනිදා,
කොළඹ දීය.

11-550/2

---

1962 අංක 469

අංකය : ඩී. 32/රෙක් ව්.

**නිලධාරීන් උසස් කිරීම්—රාජකීය ලංකා නාවික හමුදාව**

1962 ජූලි මස 1 වැනි දින සිට වැඩ බලන ලයිතන් (ඉ) හැටියට.
උප ලයිතන් (ඉ) ඩී. සී. ඩී. ලේකම්වසම්, රා.ලං.නා.හ.

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 2 වෙනිදා,
කොළඹ දීය.

11-550/3

---

1962 අංක 470

අංකය : ඩී. 32/රෙක් ව්.

**නිලධාරීන් උසස් කිරීම්—රාජකීය ලංකා නාවික හමුදාව**
**නිලධාරීන් උසස් කිරීම්—රාජකීය ලංකා නාවික හමුදාව**

1962 ජූනි මස 1 වැනි දින සිට ලයිතන් (ඊ) හැටියට.
උප ලයිතන් (ඊ) ඩී. එන්. ඒ. බෙනරගම, රා.ලං.නා.හ.

ඇන්. කෲ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 2 වෙනිදා,
කොළඹ දීය.

11-550/4

---

1962 අංක 471

මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥා පණතේ (115 වෙනි පරිච්ඡෙදයේ) 12 (1) වැනි වගන්තිය යටතේ කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් 1963 ජනවාරි මස 1 වෙනි දින සිට 1965 දෙසැම්බර් මස 31 දින දක්වා ගම්පහ අධිකරණ කොට්ඨාශයේ ක්වාසි ධුරයට රුක්ගහවිල කහටඔිවිට, "ආසියාවිලා" හි පදිංචි හමීඩ් හජ්ජියාර් මොහමඩ් පාතිබ් මහතා පත්කරන්ට යෙදුනා ඇත.

වී. ඇල්. වීරසිංහ,
කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 නොවැම්බර් මස 2 දින,
කොළඹදීය.

11-663

---

1962 අංක 472

සිංගාරම් වල්ලිපුරම් මහතා පේදුරුතුඩුව අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් පත් කර තිබේ.

වී. ඇල්. වීරසිංහ,
කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 නොවැම්බර් මස 6 වැනි දින,
කොළඹ දී ය.

11-677

---

1962 අංක 473

ආරුමුගම් නාගමනී මහතා කරෙයිතිවුහි වාසස්ථානය සහ කාර්යාලයද නින්තවුර්හි අතුරු කාර්යාලයද ඇතුව මඩකලපුව අධිකරණ කොට්ඨාශය ඇතුළත දෙමළ භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

වී. ඇල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962ක්වූ නොවැම්බර් මස 6 වැනි දින.
කොළඹදී ය.

11-723

---

## ආණ්ඩුවේ නිවේදන

අංකය : 48/4/ඒසී.

**කෘෂිකාර්මික හා කර්මාන්ත සඳහා ණය දෙන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය**

ගරු මුදල් ඇමතිතුමා විසින් කෘෂිකාර්මික හා කර්මාන්ත සඳහා ණය දෙන සංස්ථාවේ 7 වැනි අධ්‍යක්ෂ මණ්ඩලයට 1962 නොවැම්බර් මස 1 වැනි දින සිට තුන් වර්ෂයක කාලයක් සඳහා පහත සඳහන් අය පත් කරන්නට යෙදී ඇත.

සී. බී. පී. පෙරේරා මහතා, ඕ.බී.ඊ.

ආ. ජයවර්ධන,
මුදල් අමාත්‍යාංශයේ සථිර ලේකම්
වෙනුවට.

මුදල් අමාත්‍යාංශය,
1962 නෙවැම්බර් මස 8 වැනි දින,
කෙළඹ දීය.

11-617

ඇල්.ඩී.—බී. 98/38.

## ලංකා සේවිංස් බැංකු ආඥාපනත

(399 වෙනි අධිකාරය වන) ලංකා සේවිංස් බැංකු ආඥාපනතේ 12 වෙනි වගන්තිය යටතේ ලංකා සේවිංස් බැංකුවේ අධ්‍යක්ෂ මංඩලය විසින් පනවනු ලැබ, මුදල් ඇමතිවරයා විසින් අනුමත කරන ලද ව්‍යවස්ථාව.

හ. ෂ. අමරසිංහ,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 7 වෙනි දින,
කොළඹ දී ය.

### ව්‍යවස්ථාව

1956 පෙබරවාරි මස 10 වෙනි දින අංක 10,891 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1955 දරන ලංකා සේවිංස් බැංකු ව්‍යවස්ථා, එහි 6 වෙනි ව්‍යවස්ථාවේ (1) වෙනි ඡේදය යටතේ දැක්වෙන අතුරු විධානය වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"එසේ වුවද කළමනාකරු විසින්

(i) කලින් නොදන්වා තමාගේ තැන්පත් මුදල සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් යම් දිනකදී ආපසු ගැනීම සඳහා යම් කිසි මුදල් තැන්පත් කරන්නකුට අවසර දීමට,

(ii) ගණකාධිකාරී හෝ කාර්යාල සහකාර විසින් සිය අභිමතය පරිදි යම්කිසි මුදල් තැන්පත් කරන්නකුට යම් දිනකදී මුදල් ආපසු ගැනීමට අවසර දීම සඳහා බලය දීමට හෝ,

(iii) රු. 500 කට වැඩි නොවන මුදලක් යම් දිනකදී ආපසු ලබා ගැනීම සඳහා, ලැජර් අංශවල පරිපාලකවරුන්ට සිය අභිමතය පරිදි යම්කිසි මුදල් තැන්පත් කරන්නකුට අවසර දීම සඳහා බලය දීමට

හැකි ය."

11-618

---

## 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනත

### ආඥාව

1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 වෙනි වගන්තියේ (1) හා (4) වෙනි උප වගන්තිවලින් හා 4 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පරිදි, අධිකරණ අමාත්‍ය සැමුවෙල් පීටර් ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු වන මම, මෙයින්—

(අ) පහත සඳහන් තැනැත්තන් කලුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර පස්දුන් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි ගඟබඩපත්තු ගම්ප්‍රදේශය සඳහා සමන්විත සමගි මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් පත් කරමි.

(1) පාහියන්ගල පදිංචි පූජ්‍ය වැවල ධම්මරංසි ස්ථවිරයන් වහන්සේ.

(2) දෙල්මැල්ල පදිංචි පූජ්‍ය මිල්ලැව සරණතිස්ස ස්ථවිර යන් වහන්සේ.

(3) ගෝවින්න පදිංචි මද්දුමගේ දොන් චාර්ලිස් වෛද්‍යතිලක.

(4) යටගම්පිටිය පදිංචි කේ. ඩී. ප්‍රේමරත්න.

(5) හල්වතුර පදිංචි එස්. බී. සරත්චන්ද්‍ර.

(6) ඕපල්ල පදිංචි රාජපක්ෂ ලියනගේ මේලියස් පෙරේරා.

(7) දකුණු මහගම පදිංචි කරන්දෙනියගේ පොඩිනෝරිස් සෝමසිරි.

(8) පහළ කරන්නාගොඩ පදිංචි දොන් මර්තේලිස් විජේනායක.

(9) පහළ කරන්නාගොඩ පදිංචි දොන් පීටර් වීරක්කොඩි විජේගුණවර්ධන.

(10) පහල නාරගල පදිංචි පහළගේ දොන් ලයනල් ලීලාරත්න.

(11) ඉහළ වෙල්ගම පදිංචි ආරච්චිගේ එඩ්වඩ් සිල්වා සමරසිංහ.

(12) දියකඩුව පදිංචි රණවක ආරච්චිගේ දොන් පේරිස් අප්පුහාමි.

(13) දියකඩුව පදිංචි වලාකුළු ආරච්චිගේ ජයවර්ධන.

(14) ඇගල්ඔය පදිංචි දොන් ඉලියන් සෝමපාල රණවක.

(15) බුලත්සිංහල පදිංචි දියකඩුවගේ දොන් හේමපාල.

(16) කුඩලිගම පදිංචි ඉද්දගොඩගේ හෙන්ද්‍රික් සිංඤෝ.

(17) වෙල්ගම පදිංචි ඩී. යසපාල.

(18) රුවියල පදිංචි විලේගොඩ ලියනගේ රොමානිස්.

(19) ගෝවින්න පදිංචි රොබට් ලියනගේ විජේවික්‍රම.

(20) අමරගෙදර පදිංචි ලොකු උඩුවගේ දිනෝරිස් පෙරේරා.

(21) නාහල්ල පදිංචි ජයනෙත්ති කෝරළලාගේ සමරපාල සමරසේකර.

(22) යටගම්පිටිය පදිංචි වටගල හේවගේ සාරිස් අබයරත්න.

(23) වේයන්ගල්ල පදිංචි අබුසාලි මරික්කාර් මොහමඩ් සහීර්.

(24) වේයන්ගල්ල පදිංචි කාසිලෙබ්බෙ මොහමඩ් හසීම් මරික්කාර්.

(25) වරකාගොඩ පදිංචි දොන් සයිමන් ගමගේ.

(26) නාහල්ල පදිංචි ගම ඇතිගේ දොන් ඉසානිස්.

(27) වරකාගොඩ පදිංචි අඟුල්මඩුව විදානලාගේ ධම්දාස.

(28) මාදොල-කිරිවානකැටිය පදිංචි දොන් සිරිවර්ධන විජේමාන්න.

(29) ගිරිකොල පදිංචි බුලත්වත්තගේ මර්තේනිස් ප්‍රනාන්දු.

(ආ) ඉහතකී මණ්ඩලයේ සභාපති වශයෙන් ගෝවින්න පදිංචි මද්දුමගේ දොන් චාර්ලිස් වෛද්‍යතිලක මහතා පත් කරමි, තවද,

(ඇ) එබඳු එක් එක් සාමාජිකයා නිලය දැරිය යුතු කාලසීමාව, මේ ආඥාව, ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දින සිට අවුරුදු 2ක් විය යුතුයයි නිශ්චය කරමි.

සැම් පී. සී. ප්‍රනාන්දු,
අධිකරණ අමාත්‍ය.

1962 නොවැම්බර් මස 6 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දිය.

11-682

---

## 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනත

### 3 (2) වෙනි වගන්තිය යටතේ කරන ලද දැන්වීමයි

1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 වෙනි වගන්තියේ 2 වෙනි උප වගන්තියේ විධිවිධාන අනුව, අධිකරණ ඇමති තැන්පත් සැමුවෙල් පීටර් ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු වන, මම, මෙහි ඇති උපලේඛනයේ සඳහන් එක් එක් ගම්ප්‍රදේශයක් සඳහා සමගිදායකයින්ගේ සභාවක් බැගින් පිහිටුවීමට අදහස් කර ඇති බව සහ ඒ ගම්ප්‍රදේශයේ ගම්කායයී සභාවද, ඒ ගම්ප්‍රදේශයේ සෑම ග්‍රාමසංවර්ධන සමිතියක් හා සෑම ප්‍රජාමණ්ඩලයක්ද, සමූපකාර සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ ඒ ගම්ප්‍රදේශයේ සෑම සමූපකාර සමිතියක්ද විසින්, නිර්දේශ මණ්ඩලයේ මතය පරිදි, ඒ සභාවේ සාමාජිකයන් වීමට සුදුසු තැනැත්තන්, 1962, දෙසැම්බර් මස 24 වෙනි දින හෝ ඊට පළමු, මා වෙත නිර්දේශ කළහැකි බව, මෙයින් දන්වමි.

සැම් පී. සී. ප්‍රනාන්දු,
අධිකරණ ඇමති.

1962, නොවැම්බර් මස 12 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

### උපලේඛනය

(1) පුත්තලම දිස්ත්‍රික්කයේ උතුරු පිටිගල් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි යගම් පත්තු ගම්ප්‍රදේශය.

(2) පුත්තලම් දිස්ත්‍රික්කයේ උතුරු පිටිගල් කෝරලේ ප්‍රදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි මුන්නේස්සරම් පත්තු ගම්ප්‍රදේශය.

(3) කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පල හත්පත්තුව ප්‍රදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි දුම්මලසූරිය ගම්ප්‍රදේශය.

(4) කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පල හත්පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි බිංගිරිය ගම්ප්‍රදේශය.

(5) කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පල හත්පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි උඩුබද්දාව ගම්ප්‍රදේශය.

(6) බදුල්ල දිස්ත්‍රික්කයේ යටිකිඳ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි පට්ටිපොල ගම්ප්‍රදේශය.

(7) බදුල්ල දිස්ත්‍රික්කයේ වියලුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි ඔයපලාත ගම්ප්‍රදේශය.

(8) කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි පාදුක්ක—වග ගම්ප්‍රදේශය.

(9) රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි කුරුවිටි කෝරලේ මැදපත්තු ගම්ප්‍රදේශය.

(10) රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි කුරුවිටි කෝරලේ පල්ලේ පත්තු ගම්ප්‍රදේශය.

(11) මාතලේ දිස්ත්‍රික්කයේ නැගෙනහිර මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි අඹන්ගඟ කෝරලේ ගම්ප්‍රදේශය.

11-775

## අනාථ නිවාස පරීක්ෂකවරු—1941 අංක 22 දරණ ආඥා පණත

1946 යේ අංක 45 දරණ ආඥා පණතින් වෙනස් කරනලද 1941 අංක 22 දරණ අනාථ නිවාස පිළිබඳ ආඥා පණතේ 5 වෙනි වගන්තියේ (1) කොටස යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති තැන්පත් මෛත්‍රීපාල සේනානායක වන මම පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ උප කොමසාරිස්වරුන් දෙදෙන අනාථ නිවාස පරීක්ෂකවරුන් හැටියට මෙම නියෝගයෙන් පත් කරමි.

මෛත්‍රීපාල සේනානායක,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික
කටයුතු පිළිබඳ ඇමති.

1962 නොවැම්බර් මස 5 දින,
කොළඹ දීය.

11-563

---

## 1949යේ අංක 18 දරණ කාර්මික නිෂ්පාදන පනත

1949 යේ අංක 18 දරණ කාර්මික නිෂ්පාදන පනතේ දෙවෙනි වගන්තිය හා අර්ථ නිරූපණ ආඥා පනතේ 2 වෙනි පරිච්ඡේදය යටතේ පැවරී ඇති බලතල අනුව ගරු කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික ඇමතිතුමා විසින් ඇල්. සී. සමරතුංග මහත්මයාගේ කාර්මික නිෂ්පාදන සහකාර පාලක ධුරය 1962.7.1 වෙනි දින සිට අවලංගු කළ බව මෙයින් දන්වමි.

වී. ඇල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් මස 5 වෙනිදා.

11-794

---

## 1958 අංක 12 දරණ තේ ආධාර මුදල් පනත

### තේ ආධාර මුදල් උපදේශක මණ්ඩලය

1958 අංක 12 දරණ තේ ආධාර මුදල් පනතේ 9 වැනි ඡේදය යටතේ සංස්ථාපිත තේ ආධාර මුදල් උපදේශක මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිතුමා විසින් 1962 ඔක්තෝබර් මස 12 වෙනි දින සිට 1964 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා ආර්. මැක්මිනිස් මහතා පත් කරන්නට යෙදුන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇම්. ශ්‍රී කාන්තා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල
අමාත්‍යාංශයේ අතිරේක ස්ථිර ලේකම්.

1962. 11. 6 දින කොළඹදී ය.

11-611

---

## 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණත

### 25 (1) වෙනි වගන්තිය යටතේ කරන නියෝගයයි

කම්කරු හා ජනසතු සේවා පිළිබඳ අමාත්‍ය ධුරන්ධර, මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, මේ සමග ඇති උපලේඛනයෙහි දක්වා ඇත්තාවූද, ලංකා ගමනාගමන මණ්ඩලයේ කටයුතු සඳහා අත්කර ගැනීමට යෝජනා කර ඇත්තාවූද, නිශ්චල දේපළ අත්කර ගැනීම, 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පනතේ 25 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට, මෙයින් අනුමත කරමි.

ඇම්. පී. ද ඉසැඩ්. සිරිවර්ධන,
කම්කරු හා ජනසතු සේවා පිළිබඳ අමාත්‍ය තැන.

1962ක්වූ නොවැම්බර් මස 8 වෙනි දින,
කොළඹදීය.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිළියන්දල සුළු නගරසභා සීමාව තුළ, වේරහැර ගමේ පිහිටි, දළ වශයෙන් පර්චස් 37ක් පමණවූ බිම් කැබැලි තුනක්.

2. (ඒ) කැබැල්ල—උතුරට: කරත්ත පාර; නැගෙනහිරට වයි. ඒ. යහෝනිස් හා පොඩිඋන්නැහේ යන අයට අයිති ඉඩම්; දකුණට සහ බස්නාහිරට: එම ඉඩමේ කොටස;

(බී) කැබැල්ල—උතුරට හා නැගෙනහිරට: වයි. ඒ යහෝනිස්ට අයිති ඉඩම; දකුණට: ජී. ඩී. යහෝනිස්ට අයිති ඉඩම; බස්නාහිරට: එම ඉඩමේ කොටස.

(සී) කැබැල්ල—උතුරට: පොඩිඋන්නැහෙට අයිති ඉඩම; නැගෙනහිරට: කේ. ඩී. ජෝසප්, සනී සහ ජී. ඩී. ගුණසේකර යන අයට අයිති ඉඩම්; දකුණට: ගම්සභා පාර; බස්නාහිරට: එම ඉඩමේ කොටස.

3. අත්කර ගැනීමට ඇති ඉඩම් කැබැලිවල විස්තර මෙසේය:—

(ඒ) කැබැල්ල—ඉඩමේ නම: ගල්හේනවත්ත; වගාව: පොල් සහ කෙසෙල්; වර්ග ප්‍රමාණය: දළ වශයෙන් පර්චස් 10ක් පමණ; අයිතිකරුගේ නම සහ ලිපිනය: වයි. ඒ. හෙලේනාහාමි, ගල්හේන වත්ත, වේරහැර.

(බී) කැබැල්ල—ඉඩමේ නම: ගල්හේනවත්ත; වගාව: වත්ත; වර්ග ප්‍රමාණය: දළ වශයෙන් පර්චස් 9ක් පමණ; අයිතිකරුගේ නම සහ ලිපිනය: පොඩිඋන්නැහේ, ගල්හේන වත්ත, වේරහැර.

(සී) කැබැල්ල—ඉඩමේ නම: ගල්හේනවත්ත: වගාව: කෙසෙල්; වර්ග ප්‍රමාණය: දළ වශයෙන් පර්චස් 18ක් පමණ; අයිතිකරුගේ නම සහ ලිපිනය: ජී. ඩී. යහෝනිස්, ගල්හේනවත්ත, වේරහැර.

11-670

---

## සමිති ආඥා පනත (123 වැනි පරිච්ඡේදය)

වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති තැන්පත්, ටිකිරි බණ්ඩාර ඉලංගරත්න වන මම, අංක 9,773 හා 1947 සැප්තැම්බර් මස 24 වැනි දින දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශය මගින්, මදක් වෙනස්කොට ඇති සමිති ආඥාපනතේ (123 වැනි පරිච්ඡේදය) 3 හා 4 වැනි වගන්තීන්ගෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර:—

(අ) "කොකුවිල් කිරුපකාර සිවසුබ්‍රමාණියා සවාමි පරිපාලන සබෙයි" නමින් හැඳින්වෙන සමිතිය, පිහිටුවීමේ අභිප්‍රාව, අංක 10,703 හා 1954 අගෝස්තු මස 13 වැනි දින හා අංක 13,134 හා 1962 මැයි මස 25 වැනි දිනයන් දරණ ගැසට් පත්‍රවල පළ කරන ලද නිවේදන වලින්, සමිති ආඥාපනතේ (123 වැනි පරිච්ඡේදය) බලතල හා පහසුකම් හිමි කරන ලද අභිප්‍රාවක් බව මෙම නිවේදනයෙන් අනුමත කරමි.

(ආ) 5(1) හා 5(4) වැනි වගන්තියේ විධිවිධානයන්ගෙන් එම සමිතිය නිදහස් කිරීමෙන්, එම සමිතිය වෙනුවෙන් එකී ආඥාපනතේ අදාලවීම සීමාකරමි.

ටී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු
පිළිබඳ ඇමති.

1962 නොවැම්බර් 6 වැනි දින,
කොළඹදී ය.

11-598

---

එල්. ඩී. බී. 128/39.

## මිල පාලන පනත

අර්ථ නිරූපන පනතේ (2 පරිච්ඡේදය) 12 වැනි වගන්තිය හා සමග කියැවීමේදී මිල පාලන පනතේ (173 පරිච්ඡේදය) 2 වගන්තිය යටතේ වාණිජ, වෙළඳ, ආහාර සහ නැව් කටයුතු පිළිබඳ ඇමතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව එතුමා—

(1) 1962 නොවැම්බර් 1 දින සිට මෙහි උපලේඛනයෙහි සඳහන් සහකාර ආහාර පාලකවරුන් සිය රාජකාරි වලට අතිරේකව මුළු දිවයින සඳහාම සහකාර මිලපාලකවරුන් (විවිධ ද්‍රව්‍ය) වශයෙන් පත් කර ඇති අතර;

(2) ඉහත කී දිනයේ සිට, 1962 ජූලි 27 දින සහ අංක 13,230 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නියෝගය අවලංගු කර තිබේ.

කේ. අල්වාපිල්ලේ,
වාණිජ, වෙළඳ, ආහාර සහ නැව් කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 නොවැම්බර් 1 දින,
කොළඹ.

උපලේඛනය

ජෝෂප් මයිකල් ඔස්වල්ඩ් මුතුපුල්ලේ,
පටබැඳි මුහන්දිරම්ගේ මැන්ඩිස් විජේසූරිය
ජෝෂප් තුරෙයිවෙල්වම් තම්බිමුත්තු
චාර්ල්ස් සැම්සන් රණසූරිය
තුඅන් ඉසකින් කාසිම්
වෙල්ලයියා නිච්කුනානන්දන්
අරම්බමූර්ති සුන්දරමූර්ති
සිල්වෙස්ටර් ජස්ටින් විජේසේකර
පරමනාදන් වෙල්වරත්නම්
කන්දයියා සිවප්‍රගාශම්
සන්දරසේගරම් සිවසුබ්‍රමනියම්
ගාර්දියා පුංචිහේවා බුද්ධදාස ද සිල්වා
හෙට්ටිගේ දොන් පියුඩර් බෝදිදාස
උයනගේ චන්ද්‍රදාස ද සිල්වා
සිම්ප්සන් විජේරත්න
ජෝන් වින්සන් ඥාණප්‍රගාසම්
විල්ප්‍රඩ් පැන්සිස් පර්ර්ඩිනැන්ඩු
මෙතියස් ස්ටිවන් ක්ලීටස් ගුණවර්ධන
සන්මුගම් පරමනාදන්
සතරසිංහගේ දොන් සුගතදාස
කෝරාල කංකානගේ සරනපාල අල්විස්
හේවා ඩැනී වීරරත්න
ආතර් කුත්බර්ත් බතෝලමියුස්
දේසිංහ පතිරගේ ජයතිලක ඩයස් විජේරත්න
බන්ධුල සෝමසිරි ද සිල්වා
මරියන් ඇන්තනී සිරිල් ඩේවිඩ්
නන්ද හේමලාල් ඩැනිස්ටර් සිල්වා
ෆේඩ්රික් ඩයස් වීරතුංග
චාල්ස් අබේදීර
ජෝන් ක්ලැරන්ස් ලක්ෂ්මන් මැල්ඩර් ගුණරත්න
කොළඹ මුහන්දිරම්ගේ සොලමන් ද සිල්වා
දොන් ගුණරත්න මීගොඩ
පියුඩර් කරුණාතිලක දසනායක
කන්දයියා සුබ්‍රමනියම් සන්මුගලිංගම්
තිරිමදුර රෙජිනෝල්ඩ් ලෙස්ලි ධම්සේන

11-707

---

## 1961 අංක 29 දරණ මහජන බැංකු පනත

### 24 (1) වැනි වගන්තිය යටතේ නිකුත් කරනු ලබන නියෝගය

වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති තැන්පත් ටිකිරි බණ්ඩාර ඉලංගරත්න වන මම, 1961 අංක 29 දරණ මහජන බැංකු පනතේ 24 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, 1962 නොවැම්බර් මස 19 වෙනි දින සිට සීමාසහිත සබරගමුව ප්‍රාදේශීය සමුපකාර බැංකුව විසුරුවා හරිනු ලබන බවත්, එම බැංකුවේ වත්කම් හා බැරකම් මහජන බැංකුවේ වත්කම් හා බැරකම් බවට පත්වනු ලබන බවත් මෙයින් ප්‍රකාශ කරමි.

ටී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් ඇමති.

1962.11.6 දා
කොළඹදීය.

11-676

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පලාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන් ඡෙදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේද යෙහි අදහසට ඇතුලත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පලාත් පාලන හා නිවාස ඇමති තුමා.

කොළඹ 2,
1962 ඔක්තෝබර් මස 30 වැනි දින දී ය.

උපලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ දිගල ගම්මූලාදැනි වසමේ පිහිටි මදුරුම් පියහේන නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති, අ. 1, රූ. 3, ප. 34 ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට: කුඹුර සහ සියතුගේ වත්ත; නැගෙනහිරට: වලව්වේ වත්ත; දකුණට: ගම්ඉම; බස්නාහිරට: අප්පුහාමි ආරච්චිගේ ඉඩම සහ කිරිබණ්ඩාගේ ඉඩම.

11-537

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මාතර දිස්ත්‍රික්කයේ 1963 වර්ෂයට තුවක්කු බලපත්‍ර අළුත් කිරීම

මාතර දිස්ත්‍රික්කයේ 1963 වර්ෂයට තුවක්කු තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ බලපත්‍ර අළුත් කිරීම හා අළුතෙන් තුවක්කු බලපත්‍ර නිකුත් කිරීම ඒ ඒ කොට්ඨාශවල ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් විසින් 1962 දෙසැම්බර් මස 1 වෙනිදා සිට 1963 මාර්තු 31 වෙනිදා දක්වා කරනු ලබන බ්ව ද, ඉල්ලුම් පත්‍ර කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනට යැවිය යුතු බව ද මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

**මෙම කාලය තුළ බලපත්‍ර අළුත් කිරීම ගැන ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍ර මාතර කච්චේරියේදී භාරගනු නොලැබේ.**

2. බලපත්‍රය අළුත් කිරීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රවල සඳහන් සෑම තුවක්කුවක්ම, එම බලපත්‍ර අළුත් කිරීමට ම විසින් බලය දෙන ලද නිලධාරි තැන වෙත බලපත්‍රය නිකුත් කිරීමට පෙර පරීක්ෂණය පිණිස ඉදිරිපත් කළ යුතු බව ද මෙයින් මහජනයා වෙත දැනුම් දෙමි.

3. තුවක්කු තබා ගැනීම හා පාවිච්චි කිරීම සඳහා දෙන ලද සෑම බලපත්‍රයක්ම, 1962 අවසානයේ දී අවලංගු වන බව ද, 1963 වර්ෂය සඳහා බලපත්‍ර 1962 දෙසැම්බර් මස 31 වෙනි දිනට පෙර නියමිත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයේ දී අළුත් කළ යුතු බැව් වැඩි දුරටත් මහජනයා වෙත දැනුම් දෙමි. වර්ෂ 1963 ජනවාරි මස 1 වෙනි දින සිට 1963 මාර්තු 31 වෙනිදා දක්වා බලපත්‍ර අළුත් කිරීමේ ඉල්ලුම් පත්‍ර සඳහා බලපත්‍ර ගාස්තුව හා සමාන දඩ මුදලක් ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙමි.

4. 1963 මාර්තු 31 වෙනි දා තෙක් අළුත් වැඩියා නොකරන ලද සෑම බලපත්‍රයක්ම සඳහා නඩු පවරන බව ද මෙයින් මහජනයා වෙත දැනුම් දෙමි.

එච්. ආර්. අමිට්,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතැන හා
බලපත්‍ර අධිකාරී.

1962 නොවැම්බර් මස 2 වෙනි දින,
මාතර කච්චේරියේදී ය.

11-508

---

## නුවරඑළිය දිස්ත්‍රික්කයේ 1963 වර්ෂයට තුවක්කු බලපත්‍ර අළුත්වැඩියා කිරීම

නුවරඑළිය දිස්ත්‍රික්කයේ තුවක්කු තබාගැනීමේ බලපත්‍ර 1963 වර්ෂය සඳහා අළුත්වැඩියා කිරීම 1962.11.15 වෙනි දින සිට ඒ ඒ කොට්ඨාශවල ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් විසින් කරගෙන යනු ලැබේ. මේ සම්බන්ධයෙන් ඉල්ලුම් පත්‍ර ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් වෙත යැවිය යුතුය. තුවක්කු තබා ගැනීම සඳහා දෙන ලද සෑම බලපත්‍රයක්ම 1962 දෙසැම්බර් මස 31 වෙනි දිනට ප්‍රථම අළුත් වැඩියා කළ යුතුයි. මෙසේ අළුත් වැඩියා කිරීමේදී 1962 වර්ෂයට අයත් බලපත්‍රය සමග ඊට අයිති තුවක්කු බලපත්‍ර අළුත්වැඩියා කරන නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් දිනෙන් පසු බලපත්‍ර අළුත්වැඩියා කරන අය බලපත්‍ර ගාස්තුව හා ඊට සමාන දඩ මුදලක් ගෙවිය යුතු බව මෙයින් දැනුම් දෙමි. 1963 3.31 වෙනි දින දක්වා ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් විසින් ඉහතකී දඩ මුදල් අයකර බලපත්‍ර අළුත් වැඩියා කරනු ලැබේ.

2. යම් තුවක්කු බලපත්‍රයක් 1963 වර්ෂයට අළුත්වැඩියා නොකිරීමට බලාපොරොත්තු වේ නම් එකී බලපත්‍රය හා ඊට අයිති තුවක්කුවද බලපත්‍ර අළුත්වැඩියා කරන නිලධාරීතැනට හෝ මෙම කාර්යාලයට 1962.12.31 වෙනි දිනට හෝ ඊට පෙර භාර දිය යුතුයි.

3. 1963 මාර්තු මස 31 වෙනි දිනට පෙර අළුත්වැඩියා නොකරන ලද සෑම බලපත්‍රයක් සඳහාම නඩු පවරන බවද මෙයින් දැනුම් දෙමි.

ඒ. බී. ඇල්කඩුවේ,
නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිසාපති

1962.11.3 වැනි දින,
නුවරඑළිය කච්චේරියේ දී ය.

11-575

## 1963 වර්ෂය තුවක්කු බලපත්‍ර අළුත් කිරීම
## ගාලු දිස්ත්‍රික්කය

තුවක්කු හිමියන් විසින්, 1962 දෙසැම්බර් 1 වැනි දින සිට 1962 දෙසැම්බර් 31 වැනි දින දක්වා, තමන්ගේ තුවක්කු බලපත්‍ර 1963 වර්ෂයට අළුත් කරගත යුතු බැව් මෙයින් නිවේදනය කරමි. තුවක්කු බලපත්‍ර අළුත් කිරීම සඳහා තුවක්කු බලපත්‍ර හිමියන් තමන්ගේ ප්‍රදේශය කරවන ආදායම් නිලධාරි තැන වෙත 1962 වර්ෂයට නිකුත් කරන ලද බලපත්‍රයත්, බලපත්‍ර ගාස්තු ඉදිරිපත් කළ යුතුයි. 1962 වර්‍ෂයට නිකුත්කරන් ලද බලපත්‍රය නොමැති නම්, තුවක්කු බලපත්‍රය නැතිවීමේ සහතිකය සඳහා වැඩිපුර රුපියල් 1 ක් ගෙවිය යු සි. 1962 දෙසැම්බර් 31 වැනි දින හෝ ඊට ප්‍රථම තම බලපත්‍ර අළුත් කර නොගන්නා බලපත්‍ර හිමියන්ට, බලපත්‍රය සඳහා අය කරන මුදලට සමාන මුදලක් දඩ වශයෙන් ගෙවීමට සිදුවේ. 1963 මාර්තු 31 වැනි දින දක්වා, දඩ මුදල අය කර බලපත්‍ර අළුත් කිරීම, ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් විසින් කරගෙන යනු ලැබේ. ඉන්පසු බලපත්‍ර අළුත් කිරීම කරනු ලබන්නේ කච්චේරියේ දී ය. 1963 මාර්තු 31 වැනි දින හෝ ඊට ප්‍රථම තුවක්කු බලපත්‍ර අළුත්කර නොගන්නා බලපත්‍ර හිමියන්ට විරුද්ධව නීති මාර්ගයෙන් කටයුතු කරනු ලැබේ. තුවක්කු බලපත්‍ර ගාස්තු වශයෙන් මුද්දර භාරගනු නොලැබේ.

යම් තුවක්කුවක් ක්‍රියා විරහිතව ඇත්නම්, එය 1962 බලපත්‍රයත් සමග කච්චේරියට හෝ බලපත්‍ර හිමියා වසන ප්‍රදේශය කරවන ආදායම් නිලධාරි තැන වෙත හෝ භාර දිය යුතුයි. එසේ නොකළ හොත්, නියමිත ගාස්තු ගෙවා 1963 වර්ෂය සඳහාත් බලපත්‍රයක් ගැනීමට සිදුවෙනවා ඇත.

සියළුම තුවක්කු, පිස්තෝල හා රිවෝල්වර හිමියන් බලපත්‍ර අළුත් කිරීමේදී තමන්ගේ තුවක්කු පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ යුතුයි.

ඒ. ඇස්. නවරත්නරාජා,
ගාලු දිස්ත්‍රික්කයේ දිසාපති තැන.

1962.11.5 දින,
ගාල්ලේ දිසාපති කාර්යාලයේ දී ය.

11-576

---

## පොලොන්නරු දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර
## 1963 වර්ෂය සඳහා අලුත් කිරීම

පොලොන්නරු දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර 1963 වර්ෂය සඳහා අළුත් කිරීම තමන්කඩුවේ පලාතේ ආදායම් නිලධාරි තැන විසින් 1962 නොවැම්බර් මස 21 වෙනි දින සිට පටන්ගනු ලබන බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

2. තුවක්කු සඳහා දී ඇති සෑම බලපත්‍රයක්ම 1962 දෙසැම්බර් මස 31 වැනිදාට පෙර 1963 වර්ෂය සඳහා අළුත් කර ගත යුතුයි. බලපත්‍ර අළුත් කර ගැනීමේදී 1962 වර්ෂය සඳහා නිකුත්කර ඇති බලපත්‍රද, සෝදිසි කිරීම සඳහා එම තුවක්කුද ආදායම් නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතුයි.

3. 1962 දෙසැම්බර් මස 31 වෙනිදාට පසු අලුත් කිරීමට ඉදිරිපත් කරණ සෑම බලපත්‍රයකටම එම බලපත්‍ර ගාස්තුවට සම අතිරේක මුදලක් දඩ වශයෙන් ගෙවා අළුත් කර ගන්නට සිදුවේ. යම් කිසි හේතුවක් නිසා තුවක්කු බලපත්‍රයක් අළුත්කර නොගන්නේ නම්, 1962 වර්ෂය වෙනුවෙන් නිකුත් කර ඇති බලපත්‍රයද, එම තුවක්කුවද බලපත්‍ර නිකුත් කරණ නිලධාරි තැන වෙත භාරදිය යුතුයි.

4. 1962 වර්‍ෂයට නිකුත් කර ඇති බලපත්‍රය යම්කිසිවෙකු ළඟ ඉදිරිපත් කිරීමට නැතිනම් ඒ වෙනුවෙන් සහතිකයක් නිකුත් කිරීම සඳහා අතිරේක වශයෙන් රුපියලක ගාස්තුවක් ගෙවිය යුතුයි.

5. 1963 වර්ෂයේ මාර්තු මස 31 වෙනි දිනට ප්‍රථම තුවක්කු බලපත්‍ර අළුත් කර නොගන්නා අයට විරුද්ධව නඩු පවරනු ලැබේ.

ඩබ්ලිව්. ආර්. පී. තිලකරත්න,
පොළොන්නරුවේ දිසාපති.

1962 ඔක්තෝබර් මස 20 වෙනි දින,
පොළොන්නරුවේ දිසාපති කාර්යාලයේ දී ය.

11-547

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

කොළඹ 2, වොක්සෝල් වීදියේ අංක 267 දරන ස්ථානයෙහි දැනට පිහිටා ඇති බටහිර දිශා වන නිලධාරීගේ කාර්යාලය 63.1.1 වන දින සිට රත්නපුරේ හෙලින්ස් පාරේ පිහිටා ඇති ගොඩනැගිල්ලට ගෙන යනු ඇත.

ජේ. ඇල්. ඊ. ප්‍රනාන්දු,
වැඩ බලන වන සංරක්‍ෂක.

වන සංරක්‍ෂකගේ කාර්යාලය,
කොළඹ 2, 62.11.5.

11-574

---

## දැන්වීමයි

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණිය හත්පත්තුව කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ගිනිගත්පිටිය ගම්පති කොට්ඨාශයේ වැරැල්ල ගහ වත්ත සහ පංසල් ගංගොඩ හා වැරැල්ල ගහ වත්තේ ගවයින් අතර, "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැව් 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වර්ෂ 1962.9.14 දින අංක 13,301 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1962 නොවැම්බර් 6 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
කායභීලයේ දීය.

11-593

---

## ප්‍රකාශනයයි

නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කොට්ටියාර් පත්තු කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ සෝමපුර, මහවැලිගම සහ මල්ලිගයිතිවු ගම්වල ගවයින් අතර "රක්තාශ්‍රව" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට : කොට්ටියාර් බොක්ක ; දකුණට : මහවැලි ගඟේ අත්තක් වූ වෙරුගල් ආරු සහ මඩකලපු, පොළොන්නරු දිස්ත්‍රික්ක මායිම් ; නැගෙනහිරට : බෙංගාලේ බොක්ක ; බස්නාහිරට : මහවැලිගඟේ අත්තක් වූ ගංගා සහ තම්පලකාමම් ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ මායිම්.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්තකරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර ත්‍රිකුණාමල පශු වෛද්‍ය තැනගෙන් හෝ කොට්ටියාර් පත්තු කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී තැනගේ කායභීලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 නොවැම්බර් මස 10 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරීගේ කායභීලයේ දී ය.

11-705/1

## ප්‍රකාශනයයි

නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කට්ටුකුලම් පත්තු නැගෙනහිර කරවක ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ පුල්මුඩයි සහ නල්ලවෙල්ලි ගම්වල ගවයින් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට : පෙරියආරු හෝ පරයන් ආරු ; දකුණට : ත්‍රිකුණාමල-පුල්මුඩයි මාවතේ 6 වැනි සැතැප්ම් කණුව සිට ත්‍රිකුණාමල-අනුරාධපුර මාවතේ 7 වැනි සැතැප්ම් කණුව දක්වා නිරිත දිග බලා විහිද යන කල්පිත රේඛාව ; නැගෙනහිරට : බෙංගාලබොක්ක සහ කොක්කා ළලයි කලපුව ; බස්නාහිරට : ත්‍රිකුණාමල-අනුරාධපුර මාවතේ 7 වැනි සැතැප්ම් කණුවේ සිට පෙරියආරු හෝ පරයන්ආරු හමුවන තෙක් වයඹ දිසාවට වැටී ඇති කරත්ත පාර ඔස්සේ අඛණ්ඩව විහිද යන කල්පිත රේඛාව.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වැහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්තකරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර ත්‍රිකුණාමල පශු වෛද්‍ය තැනගෙන් හෝ කට්ටුකුලම් පත්තු නැගෙනහිර කරවක ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්‍යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 නොවැම්බර් මස 1 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරීයේ කාර්‍යාලයේ දී ය.

11-705/2

---

## කැලණිය-මුදුන්ගොඩ මාර්ගයේ අංක 17/6 දරණ බෝක්කුව, උතුරු කොළඹ ප්‍රදේශය

ඉහත සඳහන් බෝක්කුවේ වැඩ දැන් අවසන් කර, මාර්ගය රථ වාහන ගමනාගමනය සඳහා විවෘත කර තිබේ.

සී. මා. පෙරේරා,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

8.11.1962.
කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේදීය.

11-702

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි